**පදවිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, **මූල්‍ය** ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පදවිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශේෂ පිරික්සුමේ දක්වා තිබුණු රු.24,000 ක් වූ හර ශේෂයක් සහ එකතුව රු.153,443 ක් වූ බැර ශේෂ 02 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) 2017 වර්ෂයේ මිලට ගෙන තිබූ රු.126,480 ක් වූ පුස්තකාල පොත් 272 ක වටිනාකම ගිණුම්ගත නොකිරීම නිසා පුස්තකාල පොත් වටිනාකම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පුරනැගුම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත ඉදිකර තිබුණු වටිනාකම රු.808,737 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම් වලින් අත්හැරී නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2.1 නොසැසඳුනු ගිණුම්
----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ශුද්ධ වත්කම් වල එකතුව රු.109,752,491 ක් වුවත් සමුච්චිත අරමුදල හා සංචිතවල එකතුව රු.110,053,442 ක් වූ බැවින් එම වටිනාකම් අතර රු.300,951 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශයෙහි රජයේ පුනරාවර්තන දායකත්වය රු.8,083,512 ක් ලෙස දක්වා තිබුණද, ආදායම් වියදම් ගිණුමේ පුනරාවර්තන ආදායම් ශිර්ෂ යටතේ ආදායම් ආධාර මුදල රු.8,538,316 ක් ලෙස දැක්වීම නිසා පුනරාවර්තන ආදායම්වල රු.454,804 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ලෙජර් ගිණුම් අනුව සමුච්චිත අරමුදල සහ ඌණතා ගිණුමේ ශේෂය රු.1,467,307 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම ගිණුමේ ශේෂය රු.893,856 ක් වූයෙන් ලෙජර් ගිණුම හා මූල්‍ය ප්‍රකාශන අතර රු.573,451 ක වෙනසක් පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් වල වටිනාකම රු.109,206,086 ක් වූ නමුත් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ වටිනාකම රු.109,159,586 ක් වූ බැවින් එම ගිණුම් දෙක අතර රු.46,500 ක වෙනසක් පැවතුණි.

1.3.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනඑමින් පවතින රු.216,285 ක්වූ ජල කර්මාන්ත ගබඩා ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙනඑමින් පවතින රු.13,028 ක් වූ විවිධ ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.108,663,108 ක් වූ ගිණුම් විෂයයන් 04ක් විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික හා අනියම් සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම් සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස අතුරු ව්‍යවස්ථාවක් සෑදීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් නිසි රක්ෂණාවරණ ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවට සහතික කිරීම සභාවේ |

| | | |
|---|---|---|
| | | ලේකම්වරයාගේ කර්තව්‍යයක් වුවත් එසේ රක්ෂණ ආවරණයක් ලබාගත් බවට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | රීති 115 | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී අදාල භාණ්ඩ ගිවිසුම් ප්‍රකාරව ගුණාත්මකව ගබඩාවට ලැබුණු බවටත් ඒවා උපලේඛන වල ඇතුළත් කල බවටත්, ගබඩා භාර නිලධාරියා විසින් අදාල ගෙවීම් වවුචරයේ සහතිකයක් දියයුතු වුවත් එකතු වටිනාකම රු.55,790 ක් වූ ගබඩා භාණ්ඩ මිලට ගැනීමේදී සභාව විසින් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. |
| (iii) | රීති 217 හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් P.S.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වාගෙන නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක්ම පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2014 දෙසැම්බර් 15 දිනැති අංක 2014/14 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතු එකතු වටිනාකම රු.108,663,108 ක් වූ ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණද චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් වර්ගීකරණය කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 අංක දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව භාවිතා කරන පරිගණක මෘදුකාංග පිළිබඳ වෙනම ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.229,185 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.229,787 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 2017 වර්ෂයේ බිල්කල ආදායම | 2017 රැස්කල ආදායම | | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|---|---|
| | වටිනාකම | වටිනාකම | 2017.01.01 හිඟය වටිනාකම | 2017 බිල්කල මුදලින් වටිනාකම | වටිනාකම |
| -------- | ---------- | ---------- | ---------- | ---------- | ---------- |
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | - | 550,000 | - | 346,200 | 203,800 |
| කුලී මුදල් | 36,300 | 2,964,600 | 29,300 | 2,541,385 | 430,216 |
| බලපත්‍ර ගාස්තු | 275,850 | 611,000 | 27,100 | 594,300 | 265,450 |
| සේවා සඳහා ගාස්තු | - | 316,000 | - | 271,596 | 44,404 |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 1,908,280 | 801,000 | - | 1,775,760 | 933,520 |
| වෙනත් ආදායම් | - | 1,119,000 | - | 119,660 | 999,340 |
| | ----------- | -------------- | ------------ | ------------ | ----------- |
| එකතුව | 2,220,430 | 6,361,600 | 56,400 | 5,648,901 | 2,876,730 |
| | ======= | ====== | ====== | ====== | ====== |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

ආදායම් සම්බන්ධව ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් හිඟහිටි ආදායම් ඒකක ගණන හා බිල්කල ආදායම් ඒකක ගණන දැක්වීමට සභාව අපොහොසත් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ අයකර ගැනීමට ඇස්තමේන්තුගත කර තිබුණු වෙනත් ආදායම් රු.1,119,000 ක මුදලින් එකතු කළ ආදායම රු.119,660 ක් වූයෙන් රු.999,340 ක් හෙවත් සියයට 89 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ බිල්කල ආදායම රු.550,000 ක් වූ නමුත් එයින් සියයට 62 ක් වූ රු.346,200 ක් පමණක් වර්ෂය තුළ රැස්කරගෙන තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිගහිටි වරිපනම් හා බදු ශේෂය රු.189,233 ක් විය. එහෙත් සභාවේ ලේකම්වරයා විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව වර්ෂය ආරම්භක හිග ශේෂයක් නොතිබුණි.

2.2.4 වරෙන්තු ගාස්තු හා දඩ මුදල්

-------------------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට රැස්කලයුතු දඩ මුදල් ප්‍රමාණය රු.2,709,280 ක් වුවත් ඉන් සියයට 65 ක් වූ රු.1,775,760 ක් පමණක් රැස්කරගෙන තිබූ අතර රු.933,520 ක් තව දුරටත් හිඟව පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 වනවිටත් එකී කාරණා ඉටු කිරීමට අදාලව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ). ක්‍රියාකාරී සැලැස්ම

--------------------

සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ). සන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභා බල ප්‍රදේශයේ එකතු කරනු ලබන කසළ වලින් දිරාපත් නොවන පොලිතින් වැනි ද්‍රව්‍ය පිළිසරු ව්‍යාපෘතිය අසල එළිමහන් භූමියේ එකතු කර ගිනි තබා විනාශ කිරීම සිදුවෙමින් පැවතුණි. මෙය ප්‍රදේශවාසීන්ට හා පිළිසරු ව්‍යාපෘතියේ එදිනෙදා සේවය කරන සේවකයින්ට සෞඛ්‍ය ගැටළුවලට මුහුණ දීමට සිදුවිය හැකි බැවින් මෙම ද්‍රව්‍ය ගබඩා කිරිම සඳහා ගබඩා සංකීර්ණයක් ඉදිකර ගබඩා කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණු නමුත් ඒ සම්බන්ධව දීර්ඝකාලීන වැඩ පිළිවෙලක් සභාව සතුව නොතිබුණි.

(ඈ). තිරසර සංවර්ධනය

--------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛවල සඳහන් නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | චක්‍රලේඛ අංකය | නිර්දේශ අංකය | විෂයය | | අඩුපාඩු |
|---|---|---|---|---|---|
| (අ) | 03 | 03 | වත්කම් කලමනාකරණ | i. | හිමිකම් පත්‍ර/ඔප්පු හා පිඹුරුපත් ලබාගැනීමටත් කටයුතු නොකිරීම. |
| | | | | ii. | ඉඩම් වල මායිම් ලකුණු නොකිරීම. |
| (ආ) | 06 | 2.2(iii) | මාර්ග නඩත්තුව | | අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් ස්ථාපිත නොකිරීම. |
| | | 03 | | | සභාවට අයත් මාර්ගවල සීමා ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් නොකිරීම. |
| (ඇ) | 09 | 07 | සුසාන භූමි | i. | සුසාන භූමි හා භූමදාන ස්ථාන, සුසාන භූමි හා භූමදාන ආඥා පනතේ විධිවිධාන යටතේ ප්‍රකාශයට පත් නොකිරිම. |
| | | | | ii. | සුසාන භූමිවල අයිතිය පිළිබඳ ලියවිලි සුරක්ෂිතව තබා ගැනීම ඇතුළු කාරණා 07 ක් සම්බන්ධයෙන් දක්වා ඇති ක්‍රියාපිළිවෙල අනුව කටයුතු නොකිරීම. |

3.3 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ විවිධ තනතුරු 17 ක් පුරප්පාඩු වී තිබුණු අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම නිසා සභාවේ දෛනික කටයුතු පවත්වා ගැනීමට බාධා පැමිණ තිබුණි.

(ආ) 2010 වර්ෂයට පෙර සිට අය නොවන රු.13,125 ක් වූ හිග සේවක ණය ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ එසේ නොහැකි නම් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.6, 4.3, 4.4, 4.4.1, 4.5 සහ 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය
--------------------------

3.4.1 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්
-------------------------------------

සභාව සතුව පවතින වාහන හා උපාංග 04 ක් ප්‍රයෝජනයට නොගෙන ගාල්කර තිබුණු අතර, ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අළුත්වැඩියා කිරීමට නොහැකි නම් අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.5 හඳුනාගත් පාඩු
-----------------

2017 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව රු.11,619 ක් වටිනා පුස්තකාල පොත් 48 ක් අස්ථානගත වී තිබූ නමුත් එම පොත්වල වටිනාකම 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පු.ස./01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛයෙහි 04 ඡේදය පරිදි කටයුතු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
--------------------------------------

4.1 අයවැය පාලනය
------------------

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 07 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 15 සිට සියයට 87 දක්වා වූ පරාසයක විචලනයක් සහ වියදම් විෂයයන් 04 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 24 සිට 88 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය
----------------------

2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සභාවට වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇතත්, අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.3 විගණන හා කළමණාකරන කමිටු
----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව විගණන හා කළමණාකරන කමිටු පිහිටුවා නොතිබුණි.

5 පද්ධති හා පාලන
-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පාලනය | i. දේපළ තක්සේරු නොකිරීම<br>ii. හිඟ ආදායම් රැස් කිරීම කාර්යක්ෂම නොවීම.<br>iii. ආදායම් නිලධාරීගේ වැඩ සුපරීක්ෂණය නොකිරීම. |
| (ආ) | සැලසුම් කිරීම | සංයුක්ත සැලැස්මක් ,ක්‍රියාකාරී සැලැස්මක්, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් නොකිරීම. |
| (ඇ) | ණයගැති /ණයහිමි | i. කාල විශ්ලේෂණය පිළියෙල නොකිරීම.<br>ii. උපලේඛන පිළියෙල නොකිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමණාකරනය | දිරාපත් නොවන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට කටයුතු නොකිරීම. |
| (ඉ). | ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නඩත්තු නොකිරීම. |
| (ඊ) | ස්ථාවර වත්කම් | i. වත්කම් සියල්ල ලේඛනගත නොකිරීම.<br>ii. නිශ්ක්‍රීය වත්කම් පැවතීම.<br>iii. භාණ්ඩ සමීක්ෂණයේ යෝජනා ක්‍රියාත්මක නොකිරීම.<br>iv. පවරා නොගත් දේපලවල ඉදිකිරීම් සිදු කිරිම. |
| (උ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා ඉදිරිපත් නොකිරීම. |